# ලංකාණ්ඩුවේ "ගැසට්" පත්‍රය.

ආණ්ඩුවේ අවසරයපිට ප්‍රසිද්ධකරණලදී.

නො. 8,015 — 1933ක්වූ ඔක්තෝබර් මස 27 වෙනි දිනවූ සිකුරාදා.


## Part IV. — හතරවෙනි කාණ්ඩය.

### ආණ්ඩුවේ ඉඩම් විකිණීම හෝ බදුදීම සඳහා දැන්වීම.

#### නැගෙණහිර දිසාවේ බදු විකිණීම.

වර්ෂ 1933ක්වූ දෙසැම්බර් මස 9වෙනි ශනි දින පෙරවරු 10ට නැගෙණහිර දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන් ආණ්ඩුවේ බිම්කෑබැල්ලේ අනුනව අවුරුද්දකට බද්ද ආණ්ඩුවේ ඉඩම් බදුදීම පිළිබඳ ආණ්ඩුවේ නියෝග ප්‍රකාර පොල් වැවීම පිණිස මඩකලපු කච්චේරියේදී වෙන්දේසිකරණු ලැබේ. ප්‍රිමියම් මුදල වෙනුවෙන් ඉතාම වැඩි මිළට ඉල්ලුම්කරන්නා බද්දේ ගැණුම්කාරයා වන්නේය.

බද්දේ කොන්දේසි හා ඉඩම පිළිබඳ වැඩිදුර තොරතුරු නැගෙණහිර දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේගෙන්ද, ඉඩම පිළිබඳ සිතියම සර්වේයර් ජනරාල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිවේ.

මුල් සිතියමේ නො. A 54. ගම—වාකරේ, කෝරළේ : කෝරළේපත්තු, දිස්ත්‍රික්කය : මඩකලපුව.

අන්දම්—ලදුකැලේ.

| කම කැල්ල. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | ප්‍රමාණය, අ. රූ. ප. | අක්කරයකට වෙන්දේසිය පටන්ගන්න ප්‍රිමියම් මුදල, රු. ශ. | පළමුවෙනි 30 අවුරුද්දට අක්කරයකට අවුරුදු පතා බද්ද. පළමුවෙනි 6 අවුරුද්දේ එක එක අවුරුද්දට, රු. ශ. | පළමුවෙනි 30 අවුරුද්දට අක්කරයකට අවුරුදු පතා බද්ද. ඉතිරි 24 අවුරුද්දේ එක එක අවුරුද්දට, රු. ශ. |
|---|---|---|---|---|---|---|
| 1 | කන්දලාඩිපුම් .. | මඩකලපුවේ ඇන්. කේ. නල්ල තම්බි | 9 2 38 .. | 2 80 .. | 0 60 .. | 1 80 |

වර්ෂ 1933ක්වූ ඔක්තෝබර් මස 16වෙනි දින කොළඹ ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

ආර්. ඇම්. ඇම්. වර්ස්ලි,
වැඩබලන ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේ වම්හ.

---

### ආණ්ඩුවට ඉඩම් ලබාගැනීම සම්බන්ධ දැන්වීම්.

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3කේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට ආණ්ඩුවේ කාවශ්‍යත්තයකට, ඒ නම් :—කළුතර උතුරේ විදුලිය නිපදවීමේ උප කම්හත්තශාලාවක් ඇතිකිරීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම ලබාගැණීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876යේ ඉඩම් ලබාගැණීමේ ආඥාපත්‍රයේ" යනුවෙහි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තු වල ප්‍රකාරයට උතුමාණන්වහන්සේගෙන් නිසිආකාර මට අණ ලැබීතිබේ, ඒ ඉඩමනම් :—

සිතියමේ නො. A 170. ගම—දෙසැත්‍රා කළුතර.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරතියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | ඉලක්කපිටියවත්ත වර්පණම් නො. 277දරණ කොළඹ පාරේ 7වෙනි අකාඩාශය | අවුරුදු 50 පමණ වයසැති පොල් ගහක්, පුවක්ගස් 3ක්, අවුරුදු 30ක් පමණ වයසැති අඹගස් 2කින් සහ උළුසෙවිලිකළ ගලින් බැඳි ගොඩනැගිලි 2කින් යුක්තය | උතුරුකළුතර පදිංචි විරවඨන අලිසන් සිල්වා, දෙල්දූවේ පදිංචි හෙම්බතන්තිරිගෙ එමානිස් සිල්වා, කොළඹ පදිංචි වික්ටර් කාසිච්චි, උතුරුකළුතර පදිංචි කළුදේවාගෙ මාටින් ප්‍රනාන්දුගේ අතබාලදරුවූ කළුවාදේවගේ සිල්වින් ප්‍රනාන්දු, ලියොපෝල් ප්‍රනාන්දු, ඔක්ස්ටන් ප්‍රනාන්දු, අයිරින් ප්‍රනාන්දු සහ ඇලින් ප්‍රනාන්දු | 0 0 17·4 |

එබැවින් ඉඩම අයිතිකරගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1933ක්වූ නොවැම්බර් මස 20වෙනි දින පූ. භා. 9.30ගේ කාලයමට කළුතර කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඊට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1933ක්වූ ඔක්තෝබර් මස 23වෙනි දින
කළුතර කච්චේරියේදීය.

පී. සරවනමුත්තු,
ආණ්ඩුවේ උප ඒජන්ත වම්හ.

---

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3ගේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට, ආණ්ඩුවේ කටයුත්තකට, ඒනම්:—කොත්මලේ ආණ්ඩුවේ දෙස්තරමහතාට අළුතෙන් බංගලාවක් සෑදීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම ලබාගැණීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876ගේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" හයවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට උතුමාණන්වහන්සේගෙන් නිසිආකාර මට අණ ලැබී තිබේ, ඒ ඉඩම නම්:—

සිතියමේ නො. A 113. ගම—දෙරුවදෙනිය.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරකියන්නා. | මහත, අ.රූ.ප. |
|---|---|---|---|---|
| 1 | කැටබුලාවතත.. | තේ සහ වර්පන්ටයින්ගස් ඇති ඉඩම | සිමාසහිත කැටබුලා තේ සමාගම, ඒජන්තවරූ කොළඹ ජෝර්ජ් ස්ටුවාර්ට් සහ සමාගම | 0 3 34·8 |

එබැවින් ඉඩම අයිතිකරගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1933ක්වූ නොවැම්බර් මස 22වෙනි දින දවල් 11.30ට තලවකැලේ කානායමේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයිඅන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඊට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1933ක්වූ ඔක්තෝබර් මස 23වෙනි දින
නුවරඑළියේ කච්චේරියේදීය.

ආර්. එච්. බැසම්,
ආණ්ඩුවේ උප ඒජන්ත වම්හ.

---

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3ගේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට, ආණ්ඩුවේ කටයුත්තකට, ඒනම්:—ඔපනායක් මිනිභූමියට යන්ට පාරක් හැණීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැණීම සඳහා ක්‍රියකාරණ පිණිස "වර්ෂ 1876ගේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" හයවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට උතුමාණන් වහන්සේගෙන් නිසිආකාර මට අණ ලැබීතිබේ, ඒ ඉඩම්නම්:—

මුල් සිතියමේ නො. 201. ගම—ඔපනායක්, මැදකෝරලේ.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරකියන්නා. | මහත, අ.රූ.ප. |
|---|---|---|---|---|
| 428K | අඹගහතැන්නේගොඩහේන .. | ලන්ද .. | ඇත්. බී. ඒ. පෙරේරා සහ තවත් අය .. | 0 0 3·5 |
| 447A | මිල්ලගහකුඹුරේඹිවිට නොහොත් මිල්ලගහගොඩහේන | එම .. | කේ. සියදොරිස් සහ තවත් අය .. | 0 0 5 |

එබැවින් ඉඩම් අයිතිකරගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදු ජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1933ක්වූ නොවැම්බර් මස 18වෙනි දින පෙරවරූ 10ගේ කාලයමට රත්නපුරේ කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඊට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1933ක්වූ ඔක්තෝබර් මස 18වෙනි දින
රත්නපුරේ කච්චේරියේදීය.

ඇත්. ජේ. ලඹ්ටන්,
සබරගමු පලාතේ ආණ්ඩුවේ මහා ඒජන්ත වම්හ.

---

## අන්‍ය දැන්වීම්.

මුල්ලද්දූවේ පදිංචි සෙල්ලසියා තම්බසියා වන මම මුල්ලද්දූවේ පදිංචිව එහි කන්තෝරුවක් තබාගෙන මුල්ලද්දූව දිස්ත්‍රික්කයට දෙමල භාෂා නොතාරිස් කෙනෙක්ව ඇතුලත් කරගන්නා ලෙස රීජිස්ත්‍රාර් උන්නාන්සේට අද පටන් මාස තුනකට පසු ඉල්ලුම්කරන්ට අදහස්කරගෙන සිටින බව මෙයින් දන්වමි.

සී. තම්බසියා.

1933ක්වූ ඔක්තෝබර් මස 2වෙනි
දින මුල්ලද්දූවේදීය.

ගාල්ල දිස්ත්‍රික්කයේ බෙන්තොට පදිංචි නම්බුකාරහෑලම්ගේ බුබඳස සේනාරත්න වන මා උතුරු මැද පලාතේ තමන්කඩුව දිස්ත්‍රික්කයේ පොලොන්නරුවේ සිංහල භාෂාවෙන් වැඩ කිරීමට නොතාරිස් කෙනෙකුමෙන් ඇතුළත්කරණ ලෙස රීජිස්ත්‍රාර් ජනරාල්තුමාගෙන් ඉල්ලුම්කරන්ට අදහස්කරණ බැව් වර්ෂ 1907 1වෙනි ආඥාපත්‍රයේ IB හැඩුල්පත්‍රයේ (2) ප්‍රකාර මෙයින් දැනුම්දෙමි.

N. H. B. Senaratne.

බෙන්තොටදීය.
29.9.1933.

PRINTED AT THE CEYLON GOVERNMENT PRESS, COLOMBO.